# නිර්මාණ Nirmana



## සමිඳ යළි වඩිනු මැන !

බෙත්ලෙහෙම් පුරය මට තාවතිංසය වගෙයි
උපත ලද ගවමඩුව නඳුන් උයනය හැඟෙයි
සුරඟනන් ගී අසන ගොපලු පිරිසද අගෙයි
සමිඳ යළි වඩිනු මැන! උදා තරුවද නැගෙයි

ජාතිය ද ආගම ද කුලමල ද ඇද දොඩයි
හිතේ බැහැපත්කමක් නැතුව වයිරය වඩයි
නොමිනිසා මිනිසුනට අකුල් හෙලමින් හඩයි
දෙව්පුතුට කියන්නට තිබෙන මැසිවිලි ගොඩයි

දරුන් තුරුළේ හොවා අදෝනා හඬ නගයි
කුසේ බත් පිඩක් නැති බොහෝ දෙන මහ මඟයි
කිරෙන් කා තෙලෙන් අත සෝදගන්නා වගයි
එන්න කන්නැයි කියන කෙනෙක් දැකුමට හිඟයි

නයින් මුගටින් විලස මරාගත්තත් හැපී
පලක් නැත කියන්නට අනුන් සමගින් කිපී
සමිඳ ඔබ එනතුරා උදා හිරු සේ පිපී
බෙත්ලෙහෙම් ගව ලෙනේ බලා ඉන්නෙමු අපී

♦ *රත්නා ලංකා අබේවික්‍රම* Sri Lanka

## ඇය ඔහුට ලියූ කවි - 3
## *Poetry she wrote to him*



රඹ පතක් මත විසුළ පිණි කැට සිරි පොදින්
ටිකක් ටික් හඬ හදවතේ ඇනෙනා සරින්
කළු වළාවෙන් පිරී ඇත නුඹ ගැබ් බරින්
සිතේ තනිකම නුඹ සොයා එයි සැණය කින්

සියක් ගව් දුර සිටින නුඹෙ කුටියෙන්
මලක් පිහිදන සුවඳ මට දැනුනෙන්
මඟක් දුර නෙත් යොමා උන්නෙමි කවුළුවෙන්
සුහක් දැනුනොත් ඇතිය මා හද සනසවන්

සුමුදු මල් පෙති තබා එක පිට එක සරින්
සුමුදු හදවත නිවා සනසන මුදු හඬින්
ගියෙදු හිතවත ගොඩවෙලා නුඹ තොට මුණෙන්
යළිදු එනු මැන පදවලා තොටියෙකු ලෙසින්

සුසුදු මල් සුවඳ විත් කවුළුවෙන් එබෙන සඳ
සුසුදු වත සොයනවා උණුසුමක් තියෙන වද
සුසුදු රැය සීතලය හා සුසුම් හෙලන සඳ
සුසුදු ප්‍රිය තෙපුල් නුඹ සිහිනයෙන් එවන වද

අඬහැර පාන වෙල් එළියක නෙළුම් කවී
ඇද හැර ගැයෙන දඬු හේනක පැළක කවී
අඩුකර පහන ඇතට යන පාරු කවී
ආදර කරන නුඹටයි මේ ලියන කවී

(අඥාතයි) Anon - x x x

## පාසැල් දිවියේ සිදුවූ විපතක්!

**( මේ මා සිව්වන පෙළේ සිටිය දී ය )**

නිදහස ලබාගන්නට අප කලින් මෙනේ
සිදුවූ විපතක්ය සිහියට නැග එන්නේ
අපගේ ළමා කාලෙයි මෙය සිදු වන්නේ
ඇසුවිට සැවොම පුදුමයකට පත් වන්නේ

අප සිප්සත ඉගෙන ගන්නා වෙලා වෙදි
පොල් අතු වහල යට ඉගෙනුම ලැබ ගද්දී
ගුරුතුමී අපට පාඩම කියලා දෙද්දී
වහලය කඩා වැටුණා කණු ටික පැද්දී

වහලය පාත් වනවිට මා පැන දිව්වා
ඇඟ කිසි සීරුමක්වත් මගෙ නැති වූවා
ගුරුතුමී සමග සමහරු එහි යට වූවා
ඒ මුත් කිසිවෙකුට වරදක් නොම වූවා

මුල්ගුරුතුමී හනි හනිකට හඬා ගෙන
දුව ආවාය මගෙ දරුවන් කියා ගෙන
අපි කාටවත් කරදරයක් නොවී මෙන
සැනසුම් සුසුම් හෙලුවා අප බදා ගෙන

පාසැල් දෙකක අපි ඉගෙනුම ලැබ ගත්තේ
අපි සිටියේ පොල් අතු පාසැල මත්තේ
පොල් අතු පාසැලේ ළමයින් වී සත්තේ
සරදම් කළා මට ඒ මතකය ඇත්තේ

♦ *එස්. කංකානම්ගේ*
කැකණදුර මාතර Sri Lanka

## අසිරිමත් උපත සමරමු!

සීනු හඬින් බෙත්ලෙහෙමම එක රැයකදි මත් කළ
මරියතුමිය ගවලෙන සුරවිමනක් ලෙස පත් කළ
සාමයෙ පණිවුඩය කියා විකසිත කළ මෙත් මල
ලොව පුජිත ජේසු බිළිඳු උපත ලැබූ නත් තල

තෑගිබෝග ගෙනැත් තබන දරුවන්ගේ අත් වල
දෙව් මැදුරේ ගීත හඬින් හැම හදවත් මත් කළ
අනුන් කෙරෙහි පෙමින් බැඳී සමගි දමින් එක් කළ
බෙත්ලෙහෙමෙන් මුළු ලොවටම සාමය දුන් නත් තල

වාද බේද දුර හරිමින් අද පවතින හිත් තුළ
දෙව්මැණිගෙ ගීසරයෙන් මෙත් සිසිලෙන් මත් කළ
සතුටු සිනා වැඩිවී දුක් සියළු සිතින් අත් හළ
ජාතිබේද දුරුකරමින් සමරමු අපි නත් තල

♦ *අපරැක්කේ සුනිල්* - Sri Lanka

## නත්තල් රැය

මිණි කිරුළින් නැගුණ කිරණ බිළිඳු දෙපා ඔප කළේය
චන්දන කුංකුම කස්තුරි සුවඳ සැම තැන හැලේය
දේව දූත ගීත හඬින් බැති සිත් චාමර සැලේය
ඒ මහ රැ ගව ඔරුවක් අල්තාරය ලෙස දිලේය!

♦ *මුතුමානි රාජහෙට්ටි* - Sri Lanka

## Two Leaves & a bud

Near Talawakele in an early morning chill
Over vast terraced hills of emerald green bushes
A warming sun lifts wisps of blue-grey mist.
From steep pathways turbaned Kanganis supervise,
Hundreds of female pickers,
In their colourful sarees, supporting wicker baskets on their backs
- often an infant strapped to their side-

Like flocks of large brightly plumaged birds feeding
With nimble flick of forefinger and thumb,
Both hands working in swift rotation
Two leaves and a bud at a time over shoulders into BASKET.
From a nearby factory four long hoots from a siren beckons,
A signal to stop and file back to a weighing - room.
A gentle breeze wafts a piquant aroma from the drying chambers.

To review memoris I pour myself a cup of Orange Pekoe Dimbula Tea!

♦ **Denis Janz** - London NW8



පවනක් වීය ගත ගිම්ලන වෙලාව ට
වතුරක් වීය දිව ගිල්වෙන පිපාසෙ ට
පහනක් වීය කළුවර එන සැඳෑව ට
කඳුළක් වීය නැති කාටත් පෙනෙන් ට

**Daren - London**

## නත්තල් සාමය

දරුබර දරා පැමිණිය තුළ අඳුරු රැය
තානායමේ ඉඩ මව්හට අහිමි විය
ගව ලෙන වෙතට තැබුවේ අසරණව පිය
ඇති ඉඩ බෙදා ගන්නට වූ බැව්නි බය

සුර තුති නාද රැව් පිළිරැව් දෙන ඇසුව
දුප්පත් එඬේරුන් තණගොල්ලේ විසුව
ගවලෙන තුළින් දෙව්පුතු වැදගත් පසුව
හැමුවා දසත මදනල සාමය මුසුව

සාමය පතන මුත් සැමටම සැවොම මෙදා
නොතකති වදන දෙව්පුතුගේ ගනිති බදා
තණ්හා මාන නොමැතිව ගත්විටදි බෙදා
නිසැකව එතැන වෙයි සුබ නත්තලක් උදා

♦ *පස්කල් ජයමාන්න*
හැඳල Sri Lanka

## හඳ එළියෙ

අත්තෙන් අත්ත එල්ලා පුන් සඳ රැගෙන
රෑ යම ගෙවේ සිසිලෙන් ගත සිත නිවෙන
සිතුවිලි යට වෙවී ගත සිත දෙක දවෙන
හිත ඇතුලෙන්ම මතු වෙයි ලොවුතුරු නිවන

කිරලකු හඬයි ඉගිලී වැව් ඉවුරු කොනේ
කොවුලෝ ගී ගයති තුරු මත අසල වනේ
සඳ දිය අමා රසයක් මිහි මතට ගෙනේ
සුර ලොව අසිරි සිරි මට කවුළුවෙන් පෙනේ

රන් තරු පිපී උඩු ගුවනෙහි බැබලෙන වා
උල්කාපාත තරු ඉඳහිට ගිලිහෙන වා
කලදෝ වලා සඳ එළියෙන් දිලිසෙන වා
සඳ දෙවියනට සුදු සළු පිළි පැළඳෙන වා

වැතිරී විවේකෙන් රෑ නිදි යහන මත
සිටියදි කවුළුවෙන් එළියට ඇදෙන නෙත
ගෙන යයි අනන්තෙට නිම් හිම් රහිත හිත
සිත මිස ගතක් ඒ වගෙ මොහොතකදි නැත

මට මා අමතකව සමවැද අනන් තෙට
දහැනක ගිලුණු කල සිතුවිලි වෙමින් නට
නිකෙලෙස් බවක් මතුවී අත්දකින් නට
නිවනක් දකිය හැක සිතුවිලි තලෙන් යට

හඳ එළියකයි බුදුනට බුදු බව ආවේ
ඒ බුදු මහිමෙ සදහට ගුවනත පාවේ
කිසි දා නැති නොවෙන එය නැත ඇති වූවේ
දහමකි සනාතන ඒ සම්බුදු බාවේ

*මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*
Harrow UK

## ජීවිතය සහ අපි

**නංගී**
මෝස්තර නිරූපිකාවකි
ජීවිතය හැඩකරන

**අක්කා**
ටෙලි නාට්‍ය නිළියකි
ජීවිතය අනුභවකරන

**අයියා**
බොළඳ පෙම් කතාකරුවෙකි
ජීවිතය කටුගගා ලියන

**මල්ලි**
අංකුර කවියෙකි
ජීවිතය අහුලාගන්නට
වෙර දරන

**මම**
මානසික රෝගියෙක්මි
ජීවිතය රිසිසේ විඳින

♦ *රුවන් රත්නායක*
රිල්ලොලුව Sri Lanka

## හදිසි විවාහය

දවසින් දවසට සිත ලොල් බැඳිලා
විගසින් පෙලවහ කෙරුමට සිතලා
මනසින් වියදම් ගණනද හදලා
සතොසින් තරුණියකගෙ අත පතලා

නැකැත් බලා දිනයක් වෙන් කරලා
සිරිත් ලෙසට ආරාදන කරලා
පිරිත් කියා සැම වස් දොස් ඇරලා
අළුත් මනාලිය ගෙට ගෙනැ විල්ලා

කොහොමින් හරි මාසය ගත වූවා
මිනිහා ගැනිගෙ සිරකරු වූවා
දීගේ හරි නැත කවුරුත් කීවා
දෙන්නා වෙන්වී දෙමසක් වූවා

♦ *කුෂාන් බුද්ධික ජයසිංහ*
Kent UK

## [illegible]

කැටපතින් ඔබ දකින්නේ
ඔබේ
හරි පැත්ත නොව
වැරදි පැත්තයි.
නොහොත්
ඇත්ත නොව
නැත්තයි!

♦ *කෝ. ආරියරතන*
London

## විරහ ගිනි

මා ඔබේ මැයි කියූ
මගේ ආදර මිහිර
කොහි ගියෙද මා අතැර
මේ පාළු මාවතේ

එක් දිනක් මා මුවගෙ
රැඳුණු තොල්වල පහස
පමණක්ද අයිති මට
පවසන්න කෝ සුහද!

කියම් දෝ මා ළයෙහි
නැගී එන සෝ සුසුම්
නැත ඔබේ සවන් පත්
මා ඇසෙන මානයක

දුක් සුසුම් හාදු දී
මගේ තනි නොතනියට
තනිවේද මා යළිත්
විරහ ගිනි වෙලාගෙන

♦ *මේනු පෙරේරා*
Ilford Essex



## ඇය

ඉර නැගෙන්නටත් පෙර
ඇරඹිලා ඇගෙ දවස
එහෙ දුවයි මෙහෙ දුවයි
සැමගෙ දුක සැප සොයයි

අම්මෙ මට බඩගිනියි
මගෙ ඇඳුම කොහෙද නෑ
මෙයා මට ගහනවා
අම්මෙ මම වැසිකිළියෙ

දවසකට සියක් වර පඩි නගියි පඩි බසියි
අස්වැසිල්ලක් නොදී ඉර අවරටත් ගිහින්
කෙදින නිදහස්වෙම් ද වෙහෙසකර ජීවිතෙන්
විඩාවෙන් කෙවුණු ඇගෙ ගත සිතම ගතු කියයි

නව දිනක් උදාවී නිදහසේ සිටින ඈ
හෝරාවක් දෙකක් ගතවෙන්නටත් පෙර
තිර රෙද්ද මෑත්කර එබෙයි ජනේලය තුළින්
ඔරලෝසුවේ කටුත් ඉබිගමන් යනවාද

දොර ඇරල බලාපන් දැන් ඇගේ සිත කියයි
සීනු හඬ කන වැටී දුවගොසින් දොර අරියි
අකුරු කළ දරුවෝ කැල තුරුළුවෙති ඈ ලයට
මේ තරම් වෙන සැපක් කොහි ඇත්ද මවක් හට

♦ *ප්‍රදීපා වික්‍රමසිංහ*
London SW19